# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2021/6 - 2017 මැයි මස 29 වැනි සඳුදා - 2017.05.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ, පළාත් සභාවේ 2017 අංක 01 දරන පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධිත) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2017.05.09 වැනි දින සම්මත කරන ලදුව 2017.05.16 වැනි දින ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

ආර්. ඒ. එච්. ඒ. සමරසිංහ,<br>
ලේකම්,<br>
ඌව පළාතේ පළාත් සභාව.

2017 මැයි මස 23 වැනි දින,<br>
බදුල්ල රජ වීදියේ පිහිටි<br>
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාවේ 2017 අංක 01 දරන පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධිත) ප්‍රඥප්තිය**

මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන ''ඌව පළාත් සභාවේ 1990 අංක 2 දරන පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ පනත'' යනුවෙන් හඳුන්වා දී තිබූ ප්‍රඥප්තියේ නාමය ඉවත් කර ඒ වෙනුවට ''ඌව පළාත් සභාවේ 1990 අංක 2 දරන පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීම් ප්‍රඥප්තිය' යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය*

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාත් සභාවේ 2017 අංක 01 දරන පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීමේ (සංශෝධිත) ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්වෙන අතර එයට ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

*සභාපතිවරයාට හා නියෝජ්‍ය සභාපතිවරයාට ගෙවිය යුතු වැටුප් හා දීමනා*

2. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (ආ) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

   (ආ) ඌව පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයාට රේඛීය අමාත්‍යාංශයක නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට දැනට ගෙවනු ලබන මාසික වැටුප් හා අනෙකුත් සියලු දීමනා වලින් තුනෙන් දෙකකට සමාන මාසික වැටුප් හා දීමනා

*අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව*

3. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

06-440

1A PG 3541 — 17 (2017/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*